සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කෘෂි හා ආහාර තාක්ෂණය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසැඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

(01) ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය හා සම්බන්ධ, එල්ලංගා පද්ධතියක් යනු,

(1) දේශගුණ විපර්යාස හේතුවෙන් ඇති වූ අහිතකර කාලගුණික පද්ධතියකි.
(2) විද්‍යාත්මකව එකිනෙකට සම්බන්ධ කර ඇති වැව් පද්ධතියකි.
(3) පරිසර හිතකාමී අඩු වියදම් වගා පද්ධතියකි.
(4) කාබනික රසායනික පොහොර එක්ව යොදන ඒකාබද්ධ ශාක පෝෂක පද්ධතියකි.

(02) ශාක වර්ධනය සඳහා වැඩි ආලෝක තීව්‍රතාවයක් හා අඩු ආලෝක තීව්‍රතාවයක් අවශ්‍ය ශාක දෙකක් වනුයේ,

(1) මිරිස් හා වම්බටු ය.  (2) ඔකිඩ් හා ඇන්තූරියම් ය.
(3) මිරිස් හා කෝපි ය.  (4) ගම්මිරිස් හා ඔකිඩ් ය.

(03) පසේ ඇති ජල ආකාර අතරින් ශාකයට ලබාගත හැකි ජල ආකාරය / ආකාර වන්නේ,

(1) කේශාකර්ෂණ ජලය ය
(2) ජලාකර්ශක ජලය ය
(3) ගුරුත්වාකර්ෂණ ජලය ය
(4) කේශාකර්ශණ ජලය හා ජලාකර්ශණ ජලය ය

(04) බිම් සැකසීමේදී වැලි සහිත පසකට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමෙන්,

(1) පසේ ජලය රැඳීමේ ධාරිතාව අඩු වේ.  (2) පසේ වාතනය දුර්වල වේ.
(3) පසේ දුර්වල ජලවහන තත්ත්වයක් ඇතිවේ.  (4) පස සෝදා යාම අඩු වේ.

(05) වියළි පස් කුට්ටියක් සෙන්ටි මීටර 100 ක් පමණ උසකින් බිම පතිත කළවිට ලැබෙන පස් කැටවල ස්වභාවය අනුව නිරීක්ෂණය කෙරෙන පාංශු ලක්ෂණය වන්නේ,

(1) පාංශු ගැඹුර ය.  (2) පාංශු වයනය ය.
(3) පාංශු ව්‍යුහය ය.  (4) පාංශු වර්ණය ය.

(06) පස් නියැදි දෙකක් භාවිත කර, රෝල් ක්‍රමයෙන් පාංශු වයනය නිර්ණය කිරීමේදී, පහත A හා B රූප සටහන් වලින් දැක්වෙන නිරීක්ෂණ ලැබුණි.


A


B

A හා B පාංශු නියැදිවල පාංශු වයන කාණ්ඩ වන්නේ පිළිවෙලින්,

(1) මැටි හා වැලි ය
(2) වැලි හා වැලි ලෝම ය.
(3) මැටි හා මැටි ලෝම ය.
(4) මැටි ලෝම හා වැලි ලෝම ය.

(07) ශ්‍රී ලංකාවේ පාංශු ඛාදනය සිදුවීමට බලපාන ප්‍රධාන කාරකය වන්නේ,

(1) සුළඟ ය.
(2) වර්ෂාපතනය ය.
(3) මුහුදු රළ ය.
(4) සතුන්ගේ ක්‍රියාකාරකම් ය.

(08) වී බෝගයේ උද්භිද විද්‍යාත්මක නාමය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) Oryza Sativa
(2) oryza sativa
(3) *oryza sativa*
(4) *Oryza sativa*

(09) පොල් පැළ සිටුවීම සඳහා පැළ හා පේළි අතර නිර්දේශිත පරතරය වන්නේ,

(1) පේළි අතර මීටර 3 හා පළල අතර මීටර 3 ක් ය.
(2) පේළි අතර මීටර 8 හා පළල අතර මීටර 3 ක් ය.
(3) පේළි අතර මීටර 3 හා පැළ අතර මීටර 8 ක් ය.
(4) පේළි අතර මීටර 8 හා පැළ අතර මීටර 8 ක් ය.

(10) බිම් සැකසීම නිසා පසෙහි ප්‍රධාන වශයෙන් වෙනස්වන භෞතික ගුණය වන්නේ,

(1) පසේ වයනය ය.
(2) පසේ ව්‍යුහය ය.
(3) පසේ කැටායන හුවමාරු ධාරිතාව ය.
(4) පසේ වර්ණය ය.

(11) තවාන් පාත්තියක් සැකසීමේ දී අනුගමනය කෙරෙන <u>ප්‍රධාන පියවර</u> කිහිපයක් හා <u>ඒවාට හේතු</u> ලෙස සිසුවෙක් දක්වා ඇති A, B, C ප්‍රකාශ සලකා බලන්න.

A - තවානේ නඩත්තු පහසු කිරීම සඳහා තවානේ පළල මීටර් එකක් වන පරිදි සකසනු ලැබේ.

B - පැළ වර්ධනයට අවශ්‍ය උෂ්ණත්වය හා ආලෝකය ලබා දීම සඳහා සෙන්ටිමීටර 30 ක් පමණ උසට තවාන සකස් කරනු ලැබේ.

C - තවානෙහි සිරස් පැති සෝදී යාම වැළැක්වීමට තවානේ පැති තරමක් ආනතව හා තදට සිටින සේ සකස් කරනු ලැබේ.

මෙයින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A හා B පමණි
(2) A හා C පමණි.
(3) B හා C පමණි
(4) A, B හා C සියල්ලම ය.

(12) තවාන් පාත්තියකට යොදන <u>වසුන</u> ඉවත් කිරීම සඳහා <u>සුදුසුම අවස්ථාව</u> වන්නේ,

(1) බීජ පැළවීමට පෙර ය.
(2) බීජ පැළ පසෙන් මතුවන විටදී ය.
(3) බීජ පැළ වී සති දෙකකට පසු ය.
(4) බීජ පැළ පාත්තියෙන් ගලවන විටදී ය

(13) 


ඉහත A හා B රූප වලින් දක්වා ඇත්තේ වගා භූමියක සකසා ඇති,

(1) ජල සම්පාදන ක්‍රමයක් හා ජලවහන ක්‍රමයකි.
(2) ජලවහන ක්‍රමයක් හා ජල සම්පාදන ක්‍රමයකි
(3) ජල සම්පාදන ක්‍රම දෙකකි.
(4) ජලවහන ක්‍රම දෙකකි.

(14) වගා ක්ෂේත්‍රයක දුර්වල ජලවහන තත්ත්වයක් ඇති වීම නිසා ඇතිවන පාංශු තත්ත්වයක් වන්නේ,

(1) පසේ වාතනය දියුණු වීමය.
(2) පසේ වයනය වෙනස් වීම ය.
(3) පසේ ස්වායු ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය වැඩි වීම ය.
(4) පසේ නිර්වායු ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය වැඩි වීම ය.

(15) බෝගයකට කෘත්‍රිමව ජල සම්පාදනයේ දී පසකට ජලය යෙදිය යුතු වන්නේ,

(1) සංතෘප්ත මට්ටම තෙක් ය
(2) ක්ෂේත්‍ර ධාරිතා මට්ටම තෙක් ය.
(3) ස්ථිර මැලවීමේ අංකය තෙක් ය.
(4) තාවකාලික මැලවීමේ අංකය තෙක්

(16) බෑවුම් සහිත ඉඩම් සඳහා වුවද භාවිත කළ හැකි ජලසම්පාදන ක්‍රමයක් වන්නේ,

(1) ඇලි හා වැටි ජල සම්පාදනය ය.
(2) තීරු ජල සම්පාදනය ය.
(3) පිටාර ජල සම්පාදනය ය.
(4) ඉසින ජල සම්පාදනය ය.

(17) බෝග වගා කර ඇති ක්ෂේත්‍රයක A හා B ශාකවල නිරීක්ෂණය කරන ලද පෝෂක ඌණතා ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - ශාකය - මේරූ පත්‍ර කහ පැහැ වීම.

B - ශාකය - ශාක දාර කහ වී පසුව දාර පිළිස්සුණු ස්වභාවයක් ගැනීම.

A හා B ශාක සඳහා යෙදිය යුතු පොහොර වර්ග අනුපිළිවෙලින් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.

(1) යූරියා හා ඇමෝනියම් සල්ෆේට් ය.
(2) මියුරියේට් ඔෆ් පොටෑෂ් හා සුපර් පොස්පේට් ය.
(3) යූරියා හා මියුරියේට් ඔෆ් පොටෑෂ් ය.
(4) සුපර් පොස්පේට් හා මැග්නීසියම් සල්ෆේට් ය.

(18) තෙත් කලාපයේ බෝග වගා කිරීමේදී, යොදන පොහොර වැඩි ප්‍රමාණයක් ශාකවලට අවශෝෂණය කිරීම සඳහා පිළිපැදිය යුතු ක්‍රියාමාර්ගයක් වන්නේ,

(1) මුළු පොහොර ප්‍රමාණය එකවර යෙදීම ය.
(2) මුළු පොහොර ප්‍රමාණය කුඩා කොටස් ලෙස කිහිප වරකට යෙදීම ය.
(3) පස් වියළි තත්ත්වයේ ඇතිවිට පොහොර යෙදීම ය.
4) ශාකයේ මුලට ආසන්නව, පස මතුපිටින් පොහොර යෙදීම ය.

(19) නයිට්‍රජන් පෝෂකය වැඩිපුර ලබා දෙන කොළ පොහොරක් ලෙස භාවිත කිරීමට වඩාත් සුදුසු ශාකයක් වන්නේ,

(1) වල් සූරියකාන්ත ය.
(2) සැල්වීනියා ය.
(3) ගිනි තෘණ ය.
(4) ග්ලිරිසීඩියා ය.

(20) ඉහත A හා B වල් පැළෑටි වර්ග රූපාකාරය අනුව වර්ග කළ විට අයත් වන කාණ්ඩ වන්නේ පිළිවෙලින්,



A B

(1) පත් හා පළල් පත්‍ර කාණ්ඩ වලට ය.
(2) පළල් පත්‍ර හා පත් කාණ්ඩ වලට ය.
(3) පත් හා තෘණ කාණ්ඩවලට ය.
(4) කෙසෙල් වඳ පිදීම ය.

(21) රෝග වාහක කෘමීන්ගෙන් පැතිරෙන ශාක රෝගයක් වන්නේ,
(1) දියමලන්කෑම ය. (2) මුල් ගැට රෝගය ය
(3) හිටු මැරීම ය. (4) කෙසෙල් වඳ පිදීම ය.

(22) 

රූප සටහනේ දැක්වෙන රූපාන්තරණ ආකාරය දක්වන කෘමියෙකු වන්නේ,
(1) අවුලකපෝරා කුරුමිණියා ය
(2) ගොයම් මකුණා ය
(3) පිටි මකුණා ය
(4) කුඩිත්තා ය

(23) බෝග වලට හානි කරන කෘමි නොවන සත්ත්ව පළිබෝධකයෙකු වන්නේ,
(1) පිටි මකුණා ය (2) පුරුක් පණුවා ය (3) කීඩෑවා ය (4) මයිටාවා ය

(24) 


රූප සටහනේ දැක්වෙන වී ශාකයේ පත්‍රයක් A,B හා C කොටස් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පත්‍ර තලය, කර්ණිකාව, ජිහ්වලය
(2) පත්‍ර තලය, ජිහ්වලය, කර්ණිකාව
(3) කර්ණිකාව, ජිහ්වලය, පත්‍ර තලය
(4) ජිහ්වලය, කර්ණිකාව, පත්‍ර තලය

(25) ස්වභාවික වර්ධක ප්‍රචාරණ ව්‍යුහ ලෙස රෛසෝමය, කෝමය, ධාවක හා බල්බ දැක්විය හැකි ය. මෙම ව්‍යුහ සඳහා නිදසුන් පිළිවෙලින් දැක්වෙන බෝග කාණ්ඩය තෝරා දක්වන්න.
(1) එළුණු, ඉඟුරු, ඉන්නල හා වැල් අල
(2) ඉඟුරු, කිරිඅල, ගොටුකොළ, එළුණු
(3) කිරි අල, කහ, ස්ට්‍රෝබෙරි, ලීක්ස්
(4) ඉඟුරු, කිරිඅල, වැල් අල, ස්ට්‍රෝබෙරි

(26) බද්ධ කිරීමක දී අනුජය ලෙස යොදා ගනු ලබන ශාකයෙහි, තිබිය යුතු වැදගත්ම ගුණාංගයක් වන්නේ,
(1) හොඳින් වැඩුණු මුල පද්ධතියක් තිබීම ය.
(2) ඒකාකාරී ශක්තිමත් කඳක් සහිත ශාකයක් වීම ය.
(3) ඉහළ ගුණාත්මයෙන් යුක්ත අස්වැන්නක් ලබා දෙන ශාකයක් වීම ය.
(4) බීජ පැළ කිරීමෙන් ලබාගත් ශාකයක් වීම ය.

(27) ශාක ප්‍රචාරණය පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A - අතු බැඳීම මගින් නිපදවා ගන්නා පැල මුදුන් මුලක් සහිත බැවින් අහිතකර පරිසර තත්ත්ව වලට ඔරොත්තු දේ.

B - බීජ මගින් නිපදවා ගන්නා පැළවල මව් ශාකයේ ඇති සියලු ලක්ෂණ අඩංගු නොවේ.

C - පටක රෝපණය මගින් ඒකාකාරී පැළ වැඩි සංඛ්‍යාවක් ලබා ගත හැකි ය.

මෙයින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) A පමණි. (2) A හා B පමණි.
(3) B හා C පමණි. (4) A, B, C හා යන සියල්ලම ය.

(28) බෝග වගා කිරීමේදී භාවිතා කරන විවිධ ශාක ප්‍රචාරක ව්‍යුහ හා ඒ තුළ පවත්වා ගත යුතු පාරිසරික තත්ත්ව නිවැරදිව ගලපා ඇති ප්‍රකාශය තෝරන්න.

(1) දැල් ගෘහය - අඩු උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාව
(2) වීදුරු ගෘහය - අඩු උෂ්ණත්වය හා වැඩි ආර්ද්‍රතාව
(3) ඒකීය සූර්ය ප්‍රචාරකය - වැඩි උෂ්ණත්වය හා වැඩි ආර්ද්‍රතාව
(4) සරල සූර්ය ප්‍රචාරකය - අඩු උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාව

(29) ද්‍රව මාධ්‍ය තුළ සිදු කරන නිර්පාංශු වගා ක්‍රමයකි,

(1) මුල් ගිල් වූ වගාව. (2) සිරස් මලුවල වගාව.
(3) බඳුන් තුළ වගාව. (4) තිරස් මලුවල වගාව.

(30) හේන් ගොවිතැනෙහි විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) වර්ෂාපතන රටාව අනුව බෝග වගා කිරීම ය.
(2) වසරේ ඕනෑම කාලයක දී බෝග වගා කිරීම ය.
(3) පාංශු සංරක්ෂණ ක්‍රම යොදමින් බෝග වගා කිරීම ය.
(4) එක කන්නයක දී එක බෝගයක් පමණක් වගා කිරීම ය.

(31) අන්නාසි ජෑම් නිෂ්පාදන ආයතනයක් සඳහා ඒකාකාරීව පැසුණු අස්වැන්නක් එකවර සැපයීම සඳහා වඩාත් සුදුසු වගා රටාව වන්නේ,

(1) ශෂ්‍ය මාරුව ය. (2) මිශ්‍ර බෝග වගාව ය.
(3) බහු බෝග වගාව ය. (4) ඒක බෝග වගාව ය.

(32) බෝගවල පසු අස්වනු හානි වැළැක්වීම සඳහා අස්වනු නෙළීමේදී සැලකිය යුතු වැදගත් කරුණක් වන්නේ,

(1) නෙලාගත් අස්වැන්න විවෘත පොළව මත රැස් කිරීම ය.
(2) නෙළාගත් අස්වැන්න සෙවන ඇති සිසිල් ස්ථානක තැන්පත් කිරීම ය.
(3) කිරි සහිත පලතුරු පවනේ වියලා ගැනීම ය.
(4) බණ්ඩක්කා, මෑ වැනි බෝගවල අස්වනු පරිණත අවධියට පත්වීමෙන් පසුව නෙලා ගැනීම ය.

(33) ශාකමය ආහාර මගින් පමණක් ලැබෙන විටමින් වර්ගයක් වන්නේ,

(1) විටමින් B ය. (2) විටමින් C ය. (3) විටමින් D ය. (4) විටමින් A ය.

(34) වර්තමානයේ වෙළෙඳපොළෙහි විකිණීමට ඇති සෝදා, පිරිසිදු කර කුඩා ප්‍රමාණයන්ගෙන් පැකට් කරන ලද ගොටුකොළ යනු, අගය වැඩි කරන ලද ආහාරයකි, එම නිසා එම ආහාරය

(1) සරු කළ ආහාරයකි. (2) දුබල කළ ආහාරයකි.
(3) අවම සැකසීම් කළ ආහාරයකි. (4) බිලාන්වීකරණය කළ ආහාරයකි.

(35) කුකුළන්ට වැළඳෙන පුල්ලෝරම් රෝගයේ රෝග කාරකය වන්නේ,

(1) බැක්ටීරියාව කි. (2) දිලීරය කි.

(3) වෛරසය කි. (4) ප්‍රොටෝසෝවාවෙකි.

(36) ගව දෙනකගේ ගැබ් කාලය,

(1) දින 270 කි. (2) දින 285 කි. (3) දින 300 කි. (4) දින 295 කි.

(37) ගවයන්ට වැළඳෙන වසංගත නොවන රෝගයකි;

(1) ගව රක්තපාතය. (2) කුර හා මුඛ රෝගය.

(3) බුරුළු ප්‍රදාහය. (4) කාල ගාත්‍රා රෝගය.

(38) සත්ත්ව ආහාර පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - තෘණ, රනිල හා සයිලේජ් යනු දළ ආහාර වර්ග වේ.

B - පොල් පුන්නක්කු, බඩඉරිඟු, මාළු කුඩු යනු සාන්ද්‍ර ආහාර වර්ග වේ.

C - තන්තු ප්‍රමාණය 18% ට වඩා වැඩි ආහාර දළ ආහාර වේ.

මෙයින් නිවැරදි ප්‍රකාශ වන්නේ,

(1) A හා B පමණි. (2) A හා C පමණි.

(3) B හා C පමණි. (4) A, B හා C පමණි.

(39) කුකුළු පාලනයේදී බිත්තරය තුළ කුකුළු පැටවුන් රැක බලා ගැනීමේදී ආලෝකය සපයන කාල සීමාව වන්නේ,

(1) පැය 8 කි (2) පැය 12 කි (3) පැය 18 කි (4) පැය 24 කි

(40) ආහාර ඇසුරුමක අඩංගු වන මෙම සළකුණ මගින් අදහස් කෙරෙනුයේ,

(1) එම ආහාරය අගය වැඩිකළ ආහාරයක් බව ය.

(2) එම ආහාරය සරු කළ ආහාරයක් බව ය.

(3) එම ආහාරය අපනයනය සඳහා සුදුසු ආහාරයක් බව ය.

(4) එම ආහාරය දේශීය ප්‍රමිතිවලට අනුකූල ආහාරයක් බව ය

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8145

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: කෘෂි හා ආහාර තාක්ෂණය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

- පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) වර්තමානයේ පාසල්වල ක්‍රියාත්මක වන "පාසල් සිසුන්ට දියර කිරි වීදුරුවක් ලබා දීමේ ව්‍යාපෘතිය" යටතේ රජය විසින් ගොවීන්ට ලබා දෙන අනුග්‍රහය මත උඩරට තෙත් කලාපයේ ගොවියෙක් තම බෝග වගා භූමියට අමතරව, කිරිගව පාලන ඒකකයක් ද ස්ථාපිත කිරීමට අදහස් කළේය.

(i) (a) දියර කිරි පරිභෝජනයෙන් පාසල් දරුවන්ට ලැබෙන ප්‍රධාන පෝෂකය සඳහන් කරන්න.

(b) දියර කිරි වල අන්තර්ගත කාබෝහයිඩ්‍රේට වර්ගයේ නම ලියන්න.

(ii) මෙම ප්‍රදේශයට ප්‍රධාන ලෙස මෝසම් වැසි ලැබෙන ආකාරය හා එය ඇතිවන කාල සීමාව සඳහන් කරන්න.

(iii) මෙම ප්‍රදේශයේ වගා කර ඇති ප්‍රධාන වැවිලි බෝගය නම් කරන්න.

(iv) ගොවිපළ හිමියා තම කිරි ගව පාලන ඒකකය ඇතුළත් ගොවිපොළ සමෝධානික ගොවිපොලක් ලෙස සංවර්ධනය කිරීමට අදහස් කරන ලදී. බෝග ඒකකයට අමතරව එක් කළ හැකි වෙනත් කෘෂි ඒකක දෙකක් සඳහන් කරන්න.

(v) මෙම බෝග වගා ඒකකයේ වගා කළ හැකි පත්‍රමය කොටස් ආහාරයට ගත හැකි බෝග දෙකක් සඳහන් කරන්න.

(vi) මෙම බෝග වගා ඒකකය සඳහා ජලසම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න.

(vii) මෙම බෝග වගා ඒකකයෙහි කෘමි පළිබෝධ පාලනය සඳහා අනුගමනය කළ හැකි රසායනික නොවන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(viii) මෙම ගොවිපොළෙහි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයට ගොඩ ක්‍රමය යොදා ගැනීමෙන් ලැබෙන වාසි දෙකක් සඳහන් කරන්න.

(ix) සත්ත්ව ගොවිපොලෙන් ලැබෙන දියර කිරි ආම්ලික පැසවීමේ උපක්‍රමය භාවිතය මඟින් සංරක්ෂණය කර ගන්නා ආකාර දෙකක් ලියන්න.

(x) උඩරට තෙත් කලාපයේ කිරි සඳහා ඇති කිරීමට සුදුසු යුරෝපීය එළගව වරිග දෙකක් නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) ශ්‍රී ලංකාව, එක් එක් ප්‍රදේශවල පවතින පාරිසරික විෂමතා අනුව කෘෂි පාරිසරික කලාප 46 ට බෙදා ඇත.

(i) (a) ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප වලට වර්ග කිරීම සඳහා පදනම් වී ඇති සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 1x2)

(b) පහත සඳහන් සංකේතවලින් දක්වා ඇති කෘෂි දේශගුණික කලාප නම් කරන්න.

i. WU

ii. DL (ලකුණු 1x2)

(ii) ශ්‍රී ලංකාවේ ගොවීන් අනුගමනය කරනු ලබන වගා රටා හා වගා කන්න පිළිබඳ පහත වගුව සම්පූර්ණ කරන්න.

| වැසි ලැබෙන ක්‍රමය | වැසි ලැබෙන කාලසීමාව | වගා කන්නය |
|---|---|---|
| • පළමු අන්තර් මෝසම | (c) ............................ | (e) ............................ |
| • (a) ............................ | මැයි - සැප්තැම්බර් | |
| • (b) ............................ | ඔක් - නොවැම්බර් | (f) ............................ |
| • ඊසාන දිග මෝසම | (d) ............................ | |

(ලකුණු ½ x 6 x 3)

(iii) (a) ශ්‍රී ලංකාවේ බහුලව ව්‍යාප්ත වී ඇති පස් කාණ්ඩ දෙකක් නම් කර, එම පස් කාණ්ඩ ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්කය බැගින් නම් කරන්න. (ලකුණු 01)

(b) වැහි බිංදු පස මත පතිත වී පාංශු ඛාදනය වීම වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(03) වගා ක්ෂේත්‍රයක නිසි ලෙස බිම් සැකසීමෙන් එහි වගා කරන බෝගවල මනා වර්ධනයක් හා ඉහළ අස්වැන්නක් ලබා ගත හැකි ය.

(i) (a) බිම් සැකසීමේ අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 01)

(b) බිම් සැකසීම නිසා පසෙහි දියුණු වන භෞතික ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) බිම් සැකසීමේදී භාවිත වන සත්ත්ව බලයෙන් ක්‍රියා කරන උපකරණ දෙකක් නම් කරන්න. (ලකුණු 01)

(b) ප්‍රාථමික හා ද්විතියික බිම් සැකසීමේ දී සිදු කරන කාර්යය බැගින් ලියන්න. (ලකුණු 02)

(iii) නිරෝගී දිරිමත් තවාන් පැළ ලබා ගැනීම සඳහා තවානක් නඩත්තු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හතරක් විස්තර කරන්න. (ලකුණු 04)

(04) වගා ක්ෂේත්‍රයක වල් පැළෑටි, රෝග හා කෘමි පලිබෝධ පාලනයෙන්, ප්‍රශස්ත බෝග වර්ධනයක් හා උසස් ගුණාත්මක අස්වැන්නක් ලබා ගත හැකි වේ.

(i) (a) බෝග වගාවේදී කෘමි පලිබෝධ පාලනය පිළිබඳ සැලකීමේදී 'පලිබෝධකයෙකු ලෙස හඳුන්වන්නේ කවුරුන්ද ? (ලකුණු 01)

(b) බෝග වගාවට හානි කරන කෘමි පලිබෝධකයන්ගේ ස්වාභාවික සතුරන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) පළිබෝධ පාලනයේ දී වැදගත් වන රෝග ත්‍රිකෝණය ඇඳ එහි ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 01)

(b) පහත සඳහන් ශාක රෝග ඇති කිරීමට හේතු වන රෝග කාරකය සඳහන් කරන්න.

1. දියමලන්කෑම 2. හිටුම්මැරීම (ලකුණු 02)

(iii) වගා භූමියට පිටතින් වල් පැළෑටි එකතු වීම වැළැක්වීමට යොදා ගත හැකි ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(05). වගා කිරීම සඳහා අවශ්‍ය උසස් ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිපදවා ගැනීමට ඒ ඒ බෝග අනුව විවිධ ක්‍රම යොදා ගනු ලැබේ.

(i) (a) සිටුවීම සඳහා යෝග්‍ය බීජවල තිබිය යුතු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 01)

(b) බීජ ප්‍රතිකාර කිරීමේදී පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට සුදුසු ක්‍රමයක් බැගින් විස්තර කරන්න.

- වී වල බොල් බීජ ඉවත් කර ගැනීම
- කල බීජ වැපිරීම පහසු කිරීම (ලකුණු 02)

(ii) (a) ශාක වර්ධක ප්‍රචාරණයේ වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 01)

(b) දඬු කැබලිවල මුල් අද්දවා ගැනීම සඳහා වඩාත් සුදුසු, නම් කරන ලද ප්‍රචාරක ව්‍යුහයක් අඳින්න. (ලකුණු 02)

(iii) වායව අතු බැඳීම සිදු කරන ආකාරය, රූප සටහනක් ඇඳ විස්තර කරන්න. (ලකුණු 04)

(06) පුද්ගලයෙකුගේ දෛනික ආහාර වේලෙහි අඩංගු වන පෝෂක සංඝටක පහත පෝෂණ පිරමිඩයෙහි දැක්වේ.




(i) මෙම පෝෂක පිරමීඩයෙහි A මට්ටමේ අඩංගු විය යුතු පෝෂක කාණ්ඩය නම් කර, එම පෝෂකය අඩංගු වන ආහාර දෙකක් නම් කරන්න.

| පෝෂක කාණ්ඩය | ආහාර |
|---|---|
| A ............... | 1. ................... |
| | 2. ................... |

(ලකුණු 04)

(ii) (a) ආහාර පරිරක්ෂණය යන්න හඳුන්වන්න.

(b) පහත සඳහන් ක්‍රම වලදී ආහාරය පරිරක්ෂණය වීමට බලපාන හේතුව බැගින් සඳහන් කරන්න.

(1) වියළීම (2) ශීතනය (ලකුණු 02)

(iii) (a) ආහාරයේ ස්වභාවයෙන්ම ඇති විෂ වර්ග නිසා, මිනිසාට විෂවීම සිදුවිය හැකි ආහාර වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(b) වෙළෙඳපොළෙන් නිවසට ගෙන එන ලද ආහාරයක් විෂ වීම වැළැක්වීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(07) වර්තමානයේ, ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශ මගින් සත්ත්ව පාලනය ව්‍යාපාරයක් ලෙස සාර්ථකව පවත්වා ගනු ලැබේ.

(i) ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලනය කිරීමෙන් ලැබෙන වාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) (a) කිරි ගවයන් පෝෂණයේ දී පහත සඳහන් පෝෂක ලබාදෙන ආහාරය බැගින් නම් කරන්න.

1. කාබෝහයිඩ්‍රේට 2. ප්‍රෝටීන්

3. ලිපිඩ 4. විටමින (ලකුණු 02)

(b) කිරි ගවයන් සඳහා සකස් කරනු ලබන නිවාසයක තිබිය යුතු අවශ්‍යතා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(iii) (a) ඝන ආස්තරණ ක්‍රමයට කුකුළන් ඇති කිරීමේ වාසි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(b) වාණිජ කුකුල් ගොවිපොළක් සඳහා කුකුල් පැටවුන් මිලදී ගැනීමේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 02)